70264

OL/2022(2023)/61/S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

61 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)

| | | |
|---|---|---|
| භූගෝල විද්‍යාව | I, II | පැය තුනයි |
| புவியியல் | I, II | மூன்று மணித்தியாலம் |
| Geography | I, II | Three hours |

උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය: ........................

## භූගෝල විද්‍යාව I

**උපදෙස්:**

※ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.

※ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

- අංක **1** සිට **5** දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා **තිත් ඉර මත ලියන්න.**

**1.** පෘථිවියේ මුළු භූමි ප්‍රමාණයෙන් .................. ක් ගොඩබිම් ය.
(20% / 29% / 71%)

**2.** 'ඇට්ලස්' කඳු වැටිය පිහිටා ඇත්තේ ........................................ මහාද්වීපයේ ය.
(අප්‍රිකා / ආසියා / යුරෝපා)

**3.** .................................... ගංගාව ග්ලැසියර දිය වූ ජලයෙන් ආරම්භ වන ගංගාවකි.
(රයින් / කොංගෝ / ඇමේසන්)

**4.** ශ්‍රී ලංකාවට අයත් විශාලතම දූපත ..................... ය.
(කයිට්ස් / ඩෙල්ෆ්ට් / මන්නාරම)

**5.** .......................................... ශ්‍රී ලංකාවේ ජාතික වනෝද්‍යානයකි.
(හෝර්ටන් තැන්න / නකල්ස් / සිංහරාජ)

- අංක **6** සිට **10** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් '**නි**' යන්න වටා ද වැරදි නම් '**වැ**' යන්න වටා ද රවුමක් අඳින්න.

**6.** ග්‍රැනයිට් පාෂාණවලින් සමන්විත පෘථිවි මහාද්වීපික කබොල 'සිමැග්' (Simag) ස්තරය ලෙස ද හැඳින්වේ. **නි / වැ**

**7.** රතු මුහුද සහ කළු මුහුද සම්පූර්ණයෙන්ම ගොඩබිමින් වට වූ මුහුදුවලට උදාහරණ වේ. **නි / වැ**

**8.** ඉන්දියාව, ජපානය, චීනය සහ තායිලන්තය වැනි රටවල වාණිජ පදනමකින් වී වගාව සිදු කෙරේ. **නි / වැ**

**9.** දක්ෂිණාර්ධගෝලයේ පිහිටි රටවල් අතුරෙන් ව්‍යාපාරික වශයෙන් තිරිඟු වගා කරන ප්‍රධාන රටක් වන්නේ ආර්ජන්ටිනාවයි. **නි / වැ**

**10.** 'සාර්ක්' (SAARC) රටවල් අතුරෙන් ඉහළම මානුෂ සංවර්ධන දර්ශකයක් සහිත රට ශ්‍රී ලංකාවයි. **නි / වැ**

- අංක **11** සිට **16** තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

**11.** භූ තලය හා ජල තල මත ව්‍යාප්තව ඇති ජලය වායුගෝලයට එක් වන්නේ.......................... මගිනි.

**12.** ශ්‍රී ලංකාවේ ධමනි මිනිරන් වැඩිම ප්‍රමාණයක් මිල දී ගන්නා රට ............................... යි.

[දෙවැනි පිටුව බලන්න.


**13.** පාෂාණ වර්ගීකරණයට අනුව දියමන්ති සහ කිරිගරුඬ, ................................ පාෂාණ ගණයට අයත් වේ.

**14.** පෘථිවි ශිලා ගෝලය විශාල භූ තැටි .............................. කින් සහ කුඩා භූ තැටි ගණනාවකින් සමන්විත ය.

**15.** මධ්‍යම අප්‍රිකානු 'සහෙල්' කලාපයෙහි ............................ ආපදාව නිරතුරුව හට ගනී.

**16.** පරිසර කළමනාකරණය හා සංවර්ධන කළමනාකරණය ඒකාබද්ධ කිරීම .......................... සංවර්ධනයෙහි අරමුණ වේ.

- අංක **17** සිට **19** තෙක් ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා පහත දී ඇති ප්‍රස්තාර සටහන් උපයෝගී කර ගන්න. වර්ෂයක් තුළ අනුරාධපුර සහ කොළඹ යන නගර දෙකෙහි වර්ෂාපතන හා උෂ්ණත්ව ව්‍යාප්තිය එම ප්‍රස්තාර දෙකෙන් දක්වා ඇත.




**17.** අනුරාධපුර නගරයේ උපරිම උෂ්ණත්වය වාර්තා වී ඇත්තේ .................. මාසයේදී ය.

**18.** ........................ මාසයේ දී කොළඹ නගරයේ උපරිම වර්ෂාපතනය වාර්තා විය.

**19.** 100 mm ට වඩා අධික වර්ෂාපතනයක් ලැබුණු මාස වැඩි සංඛ්‍යාවක් ඇත්තේ ............... නගරයේ ය.

- අංක **20** සිට **24** තෙක් දී ඇති ප්‍රශ්නවල '**අ**' සහ '**ආ**' යනුවෙන් තීරු දෙකක් දැක්වේ. '**අ**' තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙළට අනුව '**ආ**' තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි **අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

**20.**

| 'අ' **වායුගෝලීය ස්තරය** | 'ආ' **පිහිටීම** |
|---|---|
| 1. පරිවර්තී ගෝලය | A - වායුගෝලයේ ඉහළම ස්තරයයි. |
| 2. අපරිවර්තී ගෝලය | B - වායුගෝලයේ පහළම ස්තරයයි. |
| 3. තාප ගෝලය | C - මුහුදු මට්ටමේ සිට 48 km - 50 km පමණ දක්වා විහිදේ. |
| | D - මුහුදු මට්ටමේ සිට 50 km - 80 km අතර උන්නතාංශයක පිහිටා ඇත. |

(1) A, B, C (2) B, C, A (3) C, D, A (4) D, C, B (……)

**21.**

| 'අ' **මහාද්වීපික තටකය** | 'ආ' **දූපත** |
|---|---|
| 1. ආසියා මහාද්වීපික තටකය | A - සුමාත්‍රා |
| 2. අප්‍රිකා මහාද්වීපික තටකය | B - සයිප්‍රස් |
| 3. ඕස්ට්‍රේලියා මහාද්වීපික තටකය | C - මැඩගස්කර් |
| | D - පැපුවා නිව්ගිනියා |

(1) A, B, C (2) A, C, D (3) B, C, D (4) C, D, B (……)

[තුන්වැනි පිටුව බලන්න.

**22.**

| 'අ' වීල | 'ආ' පිහිටි මහාද්වීපය |
|---|---|
| 1. බයිකල් | A - ඕස්ට්‍රේලියාව |
| 2. අයර් | B - දකුණු ඇමෙරිකාව |
| 3. ටිටිකාකා | C - ආසියාව |
| | D - උතුරු ඇමෙරිකාව |

(1) A, B, C (2) B, C, D (3) C, A, B (4) D, A, B (......)

**23.**

| 'අ' වනාන්තර වර්ගය | 'ආ' වෘක්ෂලතා |
|---|---|
| 1. නිවර්තන තෙත් | A - කලුවර, බුරුත, තේක්ක |
| 2. වියළි මිශ්‍ර සදාහරිත | B - මාරත්මල්, අරළු, බුළු |
| 3. කඳුකර තෙත් කලාපීය | C - සපු, කීන, වල්දෙල් |
| | D - හොර, මිදෙල්ල, නැදුන් |

(1) A, B, C (2) B, A, C (3) C, D, A (4) D, A, C (......)

**24.**

| 'අ' සංචාරක ආකර්ෂණය | 'ආ' වැදගත් ස්ථානය |
|---|---|
| 1. පක්ෂීන් නැරඹීම | A - කුමන |
| 2. රළ මත ලිස්සා යාම | B - සිංහරාජය |
| 3. ජෛවවිවිධත්වය | C - නිලාවැලි |
| | D - ආරුගම්බේ |

(1) A, B, D (2) A, D, B (3) B, C, A (4) C, D, B (......)

- අංක **25** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ඊට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

**25.** ජල ගැලීම් මගින් වී වගාවට බහුලව හානි සිදුවන ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කයක් වන්නේ,
(1) කළුතර යි. (2) හම්බන්තොට යි. (3) අනුරාධපුරය යි. (4) අම්පාර යි. (......)

**26.** ශ්‍රී ලංකාවේ අඩුම බිම් ප්‍රමාණයක් වී වගාවට යෙදී ඇත්තේ නුවරඑළිය දිස්ත්‍රික්කයෙහි ය. ඊට බලපා ඇති ප්‍රධානතම හේතුව විය හැක්කේ කුමක් ද?
(1) වසර පුරා අඩු උෂ්ණත්ව ව්‍යාප්තිය
(2) අධික වාර්ෂික වර්ෂාපතනය
(3) යන්ත්‍ර භාවිතයට ඇති දුෂ්කරතාව
(4) වගාවට සුදුසු පසක් නොමැතිවීම (......)

**27.** ලෝක සහල් වෙළෙඳාම හා සම්බන්ධ විශේෂ ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
(1) ලෝකය පුරා පැතිරුණු වෙළෙඳපොළක් පැවතීම
(2) සහල් වෙළෙඳාම ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශ අතරම සිදුවීම
(3) සහල් සඳහා සංවර්ධිත රටවල විශාල වෙළෙඳපොළක් පැවතීම
(4) ජාත්‍යන්තර වෙළෙඳාමට යෙදෙන ප්‍රමාණය ඉතා අල්පවීම (......)

**28.** ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදන හා සම්බන්ධ **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) යාපනය අර්ධද්වීපය පැඟිරි වගාවට ප්‍රසිද්ධය.
(2) වැලිමඩ ප්‍රදේශයේ අර්තාපල් වගාව සාර්ථකව සිදු කෙරේ.
(3) නුවරඑළිය ආශ්‍රිතව අපනයනය සඳහා මල් වර්ග වගා කෙරේ.
(4) නිරිත දිග වෙරළාසන්න ප්‍රදේශවල කුරුඳු වගා කිරීම බහුලව සිදු කෙරේ. (......)

**29.** වර්තමානයේ වානේ නිෂ්පාදනයේ ප්‍රමුඛ ස්ථානයක් ගන්නා රට,
(1) චීනයයි. (2) ජපානයයි.
(3) ඉන්දියාවයි. (4) එක්සත් රාජධානියයි. (......)

**30.** ශ්‍රී ලංකාවේ කර්මාන්ත සංයුතිය අනුව වැඩි ප්‍රතිශතයක් හිමිව ඇත්තේ පහත සඳහන් කිනම් කර්මාන්තයට ද?
(1) ආහාර (2) රබර් හා ප්ලාස්ටික්
(3) ඇඟලුම් (4) පාන වර්ග (......)

**31.** වර්තමාන ලෝක ජන සංඛ්‍යාව බිලියන,
(1) 5 කි. (2) 6 කි. (3) 7 කි. (4) 8 කි. (......)

**32.** ලෝහමය නොවන ඛනිජ වර්ගයකට නිදසුනක් වන්නේ,
(1) ඉල්මනයිට් ය. (2) රූටයිල් ය. (3) මිනිරන් ය. (4) මැග්නීසියම් ය. (……)

**33.** මෑතක සිට ශ්‍රී ලංකාවේ බෝතල් කළ පානීය ජල භාවිතය ශීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතී. මෙයින් හෙළිවන මූලික කරුණ වන්නේ,
(1) බෝතල් කළ පානීය ජලය නිෂ්පාදනය කිරීම ලාභදායක කර්මාන්තයක් වී ඇති බව ය.
(2) ශ්‍රී ලංකාවේ ජල දූෂණය බලවත් පාරිසරික ගැටලුවක් වී ඇති බව ය.
(3) ජනතාවගේ දෛනික ජල පරිභෝජනය වැඩි වී ඇති බව ය.
(4) ඉතා පහසුවෙන් බෝතල් කළ පානීය ජලය වෙළෙඳපොළෙන් මිලදී ගැනීමට හැකි වී තිබෙන බව ය. (……)

**34.** ශ්‍රී ලංකාවේ වර්තමාන බලශක්ති අර්බුදය විසඳීම සඳහා අනුගමනය කළ යුතු වඩාත් ඵලදායී ක්‍රියාමාර්ගය කුමක් ද?
(1) පුනර්ජනනීය බලශක්ති භාවිතය ප්‍රචලිත කිරීම
(2) නව ජල විදුලි බලාගාර ඉදිකිරීම
(3) විදුලි උපකරණ භාවිතය අවම කිරීමට පියවර ගැනීම
(4) නව ගල් අඟුරු බලාගාර ආරම්භ කිරීම (……)

**35.** රටක් සංවර්ධනය කිරීමේ දී භෞතික පරිසරයේ ඇති සම්පත් උපයෝගී කරගෙන නව නිර්මාණ හා නිෂ්පාදන සකස් කරනු ලබන්නේ මිනිසා විසිනි. මෙම ක්‍රියාවලිය වඩාත් සාර්ථක කර ගැනීම සඳහා අත්‍යවශ්‍යම සාධකය වන්නේ,
(1) යටිතල පහසුකම් දියුණු කිරීමයි. (2) සුබසාධක සේවා වැඩි දියුණු කිරීමයි.
(3) මානව සම්පත සංවර්ධනය කිරීමයි. (4) ණය හා සහනාධාර පහසුකම් ලබාදීමයි. (……)

**36.** 'ටයිෆූන්' නමින් හඳුන්වනු ලබන සුළිසුළං බහුලව හටගන්නා ප්‍රදේශය ලෙස සැලකෙන්නේ,
(1) උතුරු අත්ලන්තික් සාගර කලාපයයි.
(2) නැගෙනහිර ආසියාතික වෙරළාසන්න පැසිෆික් සාගර කලාපයයි.
(3) බෙංගාල බොක්ක අවට ඉන්දියානු සාගරයයි.
(4) පිලිපීන් දූපත් ආශ්‍රිත මධ්‍යම පැසිෆික් සාගර කලාපයයි. (……)

**37.** ලෝක දේශගුණ වෙනස්වීම් කෙරෙහි බලපා ඇති මූලික සාධකය කුමක් ද?
(1) ධ්‍රැවීය අයිස් තිඩි දිය වීම
(2) සාගර ජලයේ උෂ්ණත්වය වැඩි වීම
(3) දේශගුණික මායිම් කලාප වෙනස් වීම
(4) ගෝලීය උෂ්ණත්වය වැඩිවීම (……)

- පහත **A**, **B**, **C** සහ **D** මගින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**A** - 1. තොරතුරු සන්නිවේදනය
2. සමාජ සංවර්ධනය

**B** - 1. වගාබිම්
2. වන ගහනය

**C** - 1. පුමිතිරි අනුපාතය
2. ශ්‍රම බලකාය

**D** - 1. වියපත් ජන සංඛ්‍යාව
2. සුබසාධක වියදම්

**38.** පළමුවැන්නේ වැඩිවීම දෙවැන්නේ ද වැඩිවීමට හේතුවන මාතෘකා යුගලය කුමක් ද?
(1) **A** (2) **B** (3) **C** (4) **D** (……)

**39.** පළමුවැන්නේ දියුණුව දෙවැන්නේ යහපතට මෙන්ම අයහපතට ද හේතුවන මාතෘකා යුගලය කුමක් ද?
(1) **A** (2) **B** (3) **C** (4) **D** (……)

**40.** දෙවැන්නේ අඩුවීම කෙරෙහි පළමුවැන්නේ වැඩිවීම බලපෑ හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) **A** (2) **B** (3) **C** (4) **D** (……)

* *

උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ

70067



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations Sri Lanka Department of Examinations, Sri Lanka

**61 | S | I, II**

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)
## கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)
## General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)

| | |
|---|---|
| **භූගෝල විද්‍යාව** | I, II |
| புவியியல் | I, II |
| Geography | I, II |

### භූගෝල විද්‍යාව II

※ මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.

※ I කොටසේ **01** ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් **තුනට ම** පිළිතුරු සැපයිය යුතු ය.

※ II කොටසින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය.

※ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි.**

### I කොටස

**1.** (අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය (පිටු අංක **8**) යොදා ගන්න.

- අංක (i) සිට (iv) දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(i) Ⓐ - Ⓑ රේඛාවෙන් දක්වා ඇත්තේ කුමක් ද?
(හෙල් වැටිය / සානුව / කොත් කන්ද) (ලකුණු 01 යි)

(ii) Ⓒ අක්ෂරයෙන් දක්වා ඇති ලක්ෂණය කුමක් ද?
(වගුරු බිම / කඩොලාන / ලඳු කැලෑ) (ලකුණු 01 යි)

(iii) Ⓓ අක්ෂරයෙන් දක්වා ඇති ස්ථානයෙහි උස විය හැක්කේ මීන් කවරක් ද?
(178 m / 187 m / 201 m) (ලකුණු 01 යි)

(iv) Ⓔ අක්ෂරයෙන් දක්වා ඇත්තේ කිනම් රේඛාමය වටිනාකමක් ද?
(අක්ෂාංශ / දේශාංශ / මෙට්‍රික් ඛණ්ඩාංක) (ලකුණු 01 යි)

(v) සිතියම් ප්‍රදේශයේ පිහිටි ප්‍රධාන ගංගාව ඔස්සේ විහිදෙන පරිපාලන මායිම කුමක් ද? (ලකුණු 01 යි)

(vi) Ⓟ අක්ෂරයෙන් දක්වා ඇති චතුරස්‍රාකාර ප්‍රදේශය තුළ සම්මත සංකේත මගින් නිරූපණය කෙරෙන පොදු සේවා සපයන ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

- සිතියම් ප්‍රදේශය කඩ ඉරි මගින් කලාප හතරකට වෙන් කර ඒවා [W], [X], [Y] සහ [Z] යනුවෙන් නම් කර ඇත. ඒවා හොඳින් අධ්‍යයනය කර (vii), (viii) සහ (ix) ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(vii) විශාල ප්‍රදේශයක් ගංවතුර තර්ජනයට ලක් විය හැකි කලාපය කුමක් ද? (ලකුණු 01 යි)

(viii) රබර් වගාව වැඩි වශයෙන් ව්‍යාප්තව ඇති කලාපය කුමක් ද? (ලකුණු 01 යි)

(ix) වැඩියෙන්ම ජනාවාස ව්‍යාප්ත වී ඇති කලාපය කුමක් ද? (ලකුණු 01 යි)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව දක්වා ඇති තීරුවේ කොටු (පිටු අංක **9**) යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබදව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

(i) ජපන් මුහුද - Ⓦ, Ⓧ, Ⓨ

(ii) මහා බෙදුම් කඳු - Ⓠ, Ⓡ, Ⓢ

(iii) ජිබ්‍රෝල්ටාර් සමුද්‍ර සන්ධිය - Ⓜ, Ⓝ, Ⓞ

(iv) රියෝ ද ජැනීරෝ නගරය - Ⓚ, Ⓣ, Ⓤ

(v) සැක්‍රමැන්ටෝ ගංගාව - Ⓓ, Ⓔ, Ⓕ

(ලකුණු 05 යි)

[හයවැනි පිටුව බලන්න.

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබදව දක්වා ඇති තීරුවේ කොටු (පිටු අංක **9**) යොදා ගන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබදව ඇති නියමිත කොටුව තුළ ලියා දක්වන්න.

(i) ඩෙල්ෆ්ට් දූපත - Ⓠ, Ⓡ, Ⓢ

(ii) වික්ටෝරියා ජලාශය - Ⓟ, Ⓣ, Ⓤ

(iii) මීටියාගොඩ කෙඔලින් නිධිය - Ⓦ, Ⓧ, Ⓨ

(iv) මොණරාගල දිස්ත්‍රික්කය - Ⓐ, Ⓑ, Ⓒ

(v) පාසිකුඩා වෙරළ - Ⓙ, Ⓚ, Ⓛ (ලකුණු 05 යි)

## II කොටස

**2.** (i) පෘථිවියේ ජලය ව්‍යාප්ත වී ඇති ආකාර **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ජලයේ ගුණාත්මක බව අඩුවීම කෙරෙහි බලපා ඇති මානුෂ ක්‍රියාකාරකම් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ජල සංරක්ෂණය සඳහා ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කර ඉන් **එක්** ක්‍රියාමාර්ගයක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**3.** (i) පස නිර්මාණය වීමට බලපාන සාධක **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)


(ii) පස පරිහරණය හා සම්බන්ධ ගැටලු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) පස සංරක්ෂණය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කරන්න.
(b) ජීවීන්ගේ පැවැත්ම සඳහා පස ප්‍රයෝජනවත් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**4.** (i) ලෝක කෘෂිකර්මය දිගු කලක් තිස්සේ වෙනස්කම්වලට භාජනය වෙමින් පැවතුණද වර්තමානයේත් එහි වැදගත්කම අඩු වී නැත. එසේ වීමට හේතු **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ii) යාබද සිතියමෙහි Ⓐ, Ⓑ සහ Ⓒ යනුවෙන් දිස්ත්‍රික්ක යුගල තුනක් දක්වා ඇත. තේ, පොල් සහ රබර් යන වගා අතුරින් Ⓐ, Ⓑ සහ Ⓒ යන දිස්ත්‍රික්ක යුගලවල ප්‍රමුඛස්ථානය ගන්නා වගාව කුමක් දැයි අනුපිළිවෙළින් දක්වන්න. (ලකුණු 03 යි)

(iii) පොල් ආශ්‍රිත නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට හේතුවන ආකාරය නිදසුන් **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)




**5.** (i) කර්මාන්ත ස්ථානගතවීම කෙරෙහි බලපාන සාධක **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ කර්මාන්ත කිහිපයක් පහත වරහන් තුළ සඳහන් වේ.

(මැණික්, සංචාරක, සහල් පිටි නිෂ්පාදන, මිනිරන්, ටයර් ටියුබ්, වෙළෙඳාම)

ඉහත කර්මාන්ත අතුරින්

(a) කෘෂි බෝග පාදක කරගත් කර්මාන්ත **එකක්** ද

(b) ඛනිජ පාදක කර ගත් කර්මාන්ත **එකක්** ද

(c) සේවා පාදක කර ගත් කර්මාන්ත **එකක්** ද නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ පිඟන් මැටි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය හා සම්බන්ධ නව ප්‍රවණතා **තුනක්** සඳහන් කර එමඟින් රටේ ආර්ථික සංවර්ධනයට ලැබෙන දායකත්වය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**6.** (i) ලෝක ජන ව්‍යාප්තිය අනුව,

(a) වැඩිම ජන සංඛ්‍යාවකින් යුතු මහාද්වීපය ද

(b) අඩුම ජන සංඛ්‍යාවකින් යුතු මහාද්වීපය ද නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටක් වුව ද ජන සංඛ්‍යාවේ ඇතැම් ලක්ෂණ අනුව සංවර්ධිත රටක ස්වභාවය දක්නට ඇත. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවෙහි පවත්නා එවැනි ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක අධික ජන සංඛ්‍යාවකින් යුක්තවීම කෙරෙහි බලපා ඇති හේතු **තුනක්** සඳහන් කරන්න.

(b) මෙම දිස්ත්‍රික්ක දෙකෙහි ජනාධික බව හේතු කොට ගෙන පැන නැගී ඇති ගැටලුවක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

**7.** (i) රටක සංවර්ධන මට්ටම මැනීම සඳහා යොදා ගන්නා නූතන මිනුම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) පසුගිය දශකය තුළ ශ්‍රී ලංකාවේ පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ ක්‍රියාත්මක කරන ලද නව සංවර්ධන ව්‍යාපෘතිවලට නිදසුන් **එක බැගින්** දක්වන්න.

(a) වරාය

(b) ගුවන් තොටුපළ

(c) අධිවේගී මාර්ග (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග තැනීම නිසා අත් වූ යහපත් ප්‍රතිඵල **තුනක්** නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**8.** (i) ලෝකයේ භූමිකම්පා ඇතිවන ප්‍රධාන කලාප **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ නායයෑම් හටගැනීම කෙරෙහි බලපාන ස්වාභාවික හේතු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) ශ්‍රී ලංකාවේ නායයෑම් තීව්‍රවීම කෙරෙහි බලපාන මානුෂ ක්‍රියාකාරකම් **තුනක්** දක්වන්න.

(b) නායයෑම් ආපදාව අවම කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගයක් දක්වා එය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

***

[අටවැනි පිටුව බලන්න.

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/இலங்கை பரீட்சைத் திணைக்களம்/Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022 (2023)
General Certificate of Education (Ord. Level) Examination, 2022 (2023)

විභාග අංකය / சுட்டெண் / **Index Number** ....................................

**(61) භූගෝල විද්‍යාව II**
**புவியியல் II**
**Geography II**

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි. / பரீட்சகரின் உபயோகத்திற்கு மட்டும் / For Examiner's Use Only

**1.** (අ) /(அ) /(a)

(i) ..........................................................................................

(ii) ..........................................................................................

(iii) ..........................................................................................

(iv) ..........................................................................................

(v) ..........................................................................................

(vi) ● ..........................................................................................

● ..........................................................................................

(vii) ..........................................................................................

(viii) ..........................................................................................


(ix) ..........................................................................................

10

[නවවැනි පිටුව බලන්න/பக். 9 ஐப் பார்க்க/See page nine


70067

(ආ) /(ஆ) /(b)




(i)
(ii)
(iii)
(iv)
(v)
5

(ඇ) /(இ) /(c)




(i)
(ii)
(iii)
(iv)
(v)
5

1. (අ) (அ) (a) $\frac{}{10}$ (ආ) (ஆ) (b) $\frac{}{5}$ (ඇ) (இ) (c) $\frac{}{5}$ = $\frac{}{20}$

69800

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]


ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**61 | II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)
**General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)**

භූගෝල විද්‍යාව II / புவியியல் II / **Geography II**

උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි




SCALE : 1 : 50,000

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**61 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Ord. Level) Examination, 2022(2023)

| | | |
|---|---|---|
| භූගෝල විද්‍යාව I, II<br>புவியியல் I, II<br>Geography I, II | | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය: ……………………

## භූගෝල විද්‍යාව I

උපදෙස්:

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.
* එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

- අංක **1** සිට **5** දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා **තිත් ඉර මත ලියන්න.**

**1.** පෘථිවියේ මුළු භූමි ප්‍රමාණයෙන් ……29%…… ක් ගොඩබිම ය.
(20% / 29% / 71%)

**2.** 'ඇට්ලස්' කඳු වැටිය පිහිටා ඇත්තේ ……අප්‍රිකා…… මහාද්වීපයේ ය.
(අප්‍රිකා / ආසියා / යුරෝපා)

**3.** ……රයින්…… ගංගාව ග්ලැසියර දිය වූ ජලයෙන් ආරම්භ වන ගංගාවකි.
(රයින් / කොංගෝ / ඇමේසන්)

**4.** ශ්‍රී ලංකාවට අයත් විශාලතම දූපත මන්නාරම… ය.
(කයිට්ස් / ඩෙල්ෆ්ට් / මන්නාරම)

**5.** …හෝර්ටන් තැන්න…… ශ්‍රී ලංකාවේ ජාතික වනෝද්‍යානයකි.
(හෝර්ටන් තැන්න / නකල්ස් / සිංහරාජ)

- අංක **6** සිට **10** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් '**නි**' යන්න වටා ද වැරදි නම් '**වැ**' යන්න වටා ද රවුමක් අඳින්න.

**6.** ග්‍රැනයිට් පාෂාණවලින් සමන්විත පෘථිවි මහාද්වීපික කබොල 'සිමැග්' (Simag) ස්තරය ලෙස ද හැඳින්වේ. නි / (වැ)

**7.** රතු මුහුද සහ කළු මුහුද සම්පූර්ණයෙන්ම ගොඩබිමින් වට වූ මුහුදුවලට උදාහරණ වේ. නි / (වැ)

**8.** ඉන්දියාව, ජපානය, චීනය සහ තායිලන්තය වැනි රටවල වාණිජ පදනමකින් වී වගාව සිදු කෙරේ. (නි) වැ

**9.** දක්ෂිණාර්ධගෝලයේ පිහිටි රටවල් අතුරෙන් ව්‍යාපාරික වශයෙන් තිරිඟු වගා කරන ප්‍රධාන රටක් වන්නේ ආර්ජන්ටිනාවයි. (නි) වැ

**10.** 'සාර්ක්' (SAARC) රටවල් අතුරෙන් ඉහළම මානුෂ සංවර්ධන දර්ශකයක් සහිත රට ශ්‍රී ලංකාවයි. (නි) වැ

- අංක **11** සිට **16** තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

**11.** භූ තලය හා ජල තල මත ව්‍යාප්තව ඇති ජලය වායුගෝලයට එක් වන්නේ..වාෂ්පීකරණය මගිනි.

**12.** ශ්‍රී ලංකාවේ ධමනි මිනිරන් වැඩිම ප්‍රමාණයක් මිල දී ගන්නා රට …ජපානය……… යි.


**13.** පාෂාණ වර්ගීකරණයට අනුව දියමන්ති සහ කිරිගරුඬ, ........විපරීත............. පාෂාණ ගණයට අයත් වේ.

**14.** පෘථිවි ශිලා ගෝලය විශාල වූ තැටි ........හත (7)..... කින් සහ කුඩා වූ තැටි ගණනාවකින් සමන්විත ය.

**15.** මධ්‍යම අප්‍රිකානු 'සහෙල්' කලාපයෙහි ....නියඟ.......... ආපදාව නිරතුරුව හට ගනී.

**16.** පරිසර කළමනාකරණය හා සංවර්ධන කළමනාකරණය ඒකාබද්ධ කිරීම ...තිරසර............ සංවර්ධනයෙහි අරමුණ වේ.

- අංක **17** සිට **19** තෙක් ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා පහත දී ඇති ප්‍රස්තාර සටහන් උපයෝගී කර ගන්න. වර්ෂයක් තුළ අනුරාධපුර සහ කොළඹ යන නගර දෙකෙහි වර්ෂාපතන හා උෂ්ණත්ව ව්‍යාප්තිය එම ප්‍රස්තාර දෙකෙන් දක්වා ඇත.




**17.** අනුරාධපුර නගරයේ උපරිම උෂ්ණත්වය වාර්තා වී ඇත්තේ ...අප්‍රේල්... මාසයේදී ය.

**18.** ...ඔක්තෝබර් මාසයේ දී කොළඹ නගරයේ උපරිම වර්ෂාපතනය වාර්තා විය.

**19.** 100 mm ට වඩා අධික වර්ෂාපතනයක් ලැබුණු මාස වැඩි සංඛ්‍යාවක් ඇත්තේ කොළඹ. නගරයේ ය.

- අංක **20** සිට **24** තෙක් දී ඇති ප්‍රශ්නවල '**අ**' සහ '**ආ**' යනුවෙන් තීරු දෙකක් දැක්වේ. '**අ**' තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙළට අනුව '**ආ**' තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි **අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

**20.**

| 'අ' **වායුගෝලීය ස්තරය** | 'ආ' **පිහිටීම** |
|---|---|
| 1. පරිවර්තී ගෝලය | A - වායුගෝලයේ ඉහළම ස්තරයයි. |
| 2. අපරිවර්තී ගෝලය | B - වායුගෝලයේ පහළම ස්තරයයි. |
| 3. තාප ගෝලය | C - මුහුදු මට්ටමේ සිට 48 km - 50 km පමණ දක්වා විහිදේ. |
| | D - මුහුදු මට්ටමේ සිට 50 km - 80 km අතර උන්නතාංශයක පිහිටා ඇත. |

(1) A, B, C    (2) B, C, A    (3) C, D, A    (4) D, C, B    (..2..)

**21.**

| 'අ' **මහාද්වීපික තටකය** | 'ආ' **දූපත** |
|---|---|
| 1. ආසියා මහාද්වීපික තටකය | A - සුමාත්‍රා |
| 2. අප්‍රිකා මහාද්වීපික තටකය | B - සයිප්‍රස් |
| 3. ඕස්ට්‍රේලියා මහාද්වීපික තටකය | C - මැඩගස්කර් |
| | D - පැපුවා නිව්ගිනියා |

(1) A, B, C    (2) A, C, D    (3) B, C, D    (4) C, D, B    (..2..)

**22.**

| 'අ' | 'ආ' |
|---|---|
| **විල** | **පිහිටි මහාද්වීපය** |
| 1. බයිකල් | A - ඕස්ට්‍රේලියාව |
| 2. අයර් | B - දකුණු ඇමෙරිකාව |
| 3. ටිටිකාකා | C - ආසියාව |
| | D - උතුරු ඇමෙරිකාව |

(1) A, B, C (2) B, C, D (3) C, A, B (4) D, A, B (..3..)

**23.**

| 'අ' | 'ආ' |
|---|---|
| **වනාන්තර වර්ගය** | **වෘක්ෂලතා** |
| 1. නිවර්තන තෙත් | A - කලුවර, බුරුත, තේක්ක |
| 2. වියළි මිශ්‍ර සදාහරිත | B - මාරත්මල්, අරළු, බුළු |
| 3. කඳුකර තෙත් කලාපීය | C - සපු, කීන, වල්දෙල් |
| | D - හොර, මීදෙල්ල, නැදුන් |

(1) A, B, C (2) B, A, C (3) C, D, A (4) D, A, C (..4..)

**24.**

| 'අ' | 'ආ' |
|---|---|
| **සංචාරක ආකර්ෂණය** | **වැදගත් ස්ථානය** |
| 1. පක්ෂීන් නැරඹීම | A - කුමන |
| 2. රළ මත ලිස්සා යාම | B - සිංහරාජය |
| 3. ජෛවවිවිධත්වය | C - නිලාවැලි |
| | D - ආරුගම්බේ |

(1) A, B, D (2) A, D, B (3) B, C, A (4) C, D, B (..2..)

- අංක **25** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ අතුරෙන් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරා ඊට හිමි **අංකය, ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

**25.** ජල ගැලීම් මගින් වී වගාවට බහුලව හානි සිදුවන ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කයක් වන්නේ,
(1) කළුතර යි. (2) හම්බන්තොට යි. (3) අනුරාධපුරය යි. (4) අම්පාර යි. (..1..)

**26.** ශ්‍රී ලංකාවේ අඩුම බිම් ප්‍රමාණයක් වී වගාවට යෙදී ඇත්තේ නුවරඑළිය දිස්ත්‍රික්කයෙහි ය. ඊට බලපා ඇති ප්‍රධානතම හේතුව විය හැක්කේ කුමක් ද?
(1) වසර පුරා අඩු උෂ්ණත්ව ව්‍යාප්තිය
(2) අධික වාර්ෂික වර්ෂාපතනය
(3) යන්ත්‍ර භාවිතයට ඇති දුෂ්කරතාව
(4) වගාවට සුදුසු පසක් නොමැතිවීම (..1..)

**27.** ලෝක සහල් වෙළෙඳාම හා සම්බන්ධ විශේෂ ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
(1) ලෝකය පුරා පැතිරුණු වෙළෙඳපොළක් පැවතීම
(2) සහල් වෙළෙඳාම ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශ අතරම සිදුවීම
(3) සහල් සඳහා සංවර්ධිත රටවල විශාල වෙළෙඳපොළක් පැවතීම
(4) ජාත්‍යන්තර වෙළෙඳාමට යෙදෙන ප්‍රමාණය ඉතා අල්පවීම (..2..)

**28.** ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදන හා සම්බන්ධ **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) යාපනය අර්ධද්වීපය පැඟිරි වගාවට ප්‍රසිද්ධය.
(2) වැලිමඩ ප්‍රදේශයේ අර්තාපල් වගාව සාර්ථකව සිදු කෙරේ.
(3) නුවරඑළිය ආශ්‍රිතව අපනයනය සඳහා මල් වර්ග වගා කෙරේ.
(4) නිරිත දිග වෙරළාසන්න ප්‍රදේශවල කුරුඳු වගා කිරීම බහුලව සිදු කෙරේ. (..1..)

**29.** වර්තමානයේ වානේ නිෂ්පාදනයේ ප්‍රමුඛ ස්ථානයක් ගන්නා රට,
(1) චීනයයි.
(2) ජපානයයි.
(3) ඉන්දියාවයි.
(4) එක්සත් රාජධානියයි. (..1..)

**30.** ශ්‍රී ලංකාවේ කර්මාන්ත සංයුතිය අනුව වැඩි ප්‍රතිශතයක් හිමිව ඇත්තේ පහත සඳහන් කිනම් කර්මාන්තයට ද?
(1) ආහාර
(2) රබර් හා ප්ලාස්ටික්
(3) ඇඟලුම්
(4) පාන වර්ග (..3..)

**31.** වර්තමාන ලෝක ජන සංඛ්‍යාව බිලියන,
(1) 5 කි. (2) 6 කි. (3) 7 කි. (4) 8 කි. (..4..)

**32.** ලෝහමය නොවන ඛනිජ වර්ගයකට නිදසුනක් වන්නේ,
(1) ඉල්මනයිට් ය. (2) රූටයිල් ය. (3) මිනිරන් ය. (4) මැග්නීසියම් ය. (..3..)

**33.** මෑතක සිට ශ්‍රී ලංකාවේ බෝතල් කළ පානීය ජල භාවිතය ශීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතී. මෙයින් හෙළිවන මූලික කරුණ වන්නේ,
(1) බෝතල් කළ පානීය ජලය නිෂ්පාදනය කිරීම ලාභදායක කර්මාන්තයක් වී ඇති බව ය.
(2) ශ්‍රී ලංකාවේ ජල දූෂණය බලවත් පාරිසරික ගැටලුවක් වී ඇති බව ය.
(3) ජනතාවගේ දෛනික ජල පරිභෝජනය වැඩි වී ඇති බව ය.
(4) ඉතා පහසුවෙන් බෝතල් කළ පානීය ජලය වෙළෙඳපොළෙන් මිලදී ගැනීමට හැකි වී තිබෙන බව ය. (..2..)

**34.** ශ්‍රී ලංකාවේ වර්තමාන බලශක්ති අර්බුදය විසඳීම සඳහා අනුගමනය කළ යුතු වඩාත් ඵලදායී ක්‍රියාමාර්ගය කුමක් ද?
(1) පුනර්ජනනීය බලශක්ති භාවිතය ප්‍රචලිත කිරීම
(2) නව ජල විදුලි බලාගාර ඉදිකිරීම
(3) විදුලි උපකරණ භාවිතය අවම කිරීමට පියවර ගැනීම
(4) නව ගල් අඟුරු බලාගාර ආරම්භ කිරීම (..1..)

**35.** රටක් සංවර්ධනය කිරීමේ දී භෞතික පරිසරයේ ඇති සම්පත් උපයෝගී කරගෙන නව නිර්මාණ හා නිෂ්පාදන සකස් කරනු ලබන්නේ මිනිසා විසිනි. මෙම ක්‍රියාවලිය වඩාත් සාර්ථක කර ගැනීම සඳහා අත්‍යවශ්‍යම සාධකය වන්නේ,
(1) යටිතල පහසුකම් දියුණු කිරීමයි. (2) සුබසාධක සේවා වැඩි දියුණු කිරීමයි.
(3) මානව සම්පත සංවර්ධනය කිරීමයි. (4) ණය හා සහනාධාර පහසුකම් ලබාදීමයි. (..3..)

**36.** 'ටයිෆූන්' නමින් හඳුන්වනු ලබන සුළිසුළං බහුලව හටගන්නා ප්‍රදේශය ලෙස සැලකෙන්නේ,
(1) උතුරු අත්ලන්තික් සාගර කලාපයයි.
(2) නැගෙනහිර ආසියාතික වෙරළාසන්න පැසිෆික් සාගර කලාපයයි.
(3) බෙංගාල බොක්ක අවට ඉන්දියානු සාගරයයි.
(4) පිලිපීන් දූපත් ආශ්‍රිත මධ්‍යම පැසිෆික් සාගර කලාපයයි. (..2..)

**37.** ලෝක දේශගුණ වෙනස්වීම් කෙරෙහි බලපා ඇති මූලික සාධකය කුමක් ද?
(1) ධ්‍රැවීය අයිස් නිධි දිය වීම
(2) සාගර ජලයේ උෂ්ණත්වය වැඩි වීම
(3) දේශගුණික මායිම් කලාප වෙනස් වීම
(4) ගෝලීය උෂ්ණත්වය වැඩිවීම (..4..)

- පහත **A**, **B**, **C** සහ **D** මගින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**A** - 1. තොරතුරු සන්නිවේදනය
2. සමාජ සංවර්ධනය

**B** - 1. වගාබිම්
2. වන ගහනය

**C** - 1. පුමිතිරි අනුපාතය
2. ශ්‍රම බලකාය

**D** - 1. වියපත් ජන සංඛ්‍යාව
2. සුබසාධක වියදම්

**38.** පළමුවැන්නේ වැඩිවීම දෙවැන්නේ ද වැඩිවීමට හේතුවන මාතෘකා යුගලය කුමක් ද?
(1) **A** (2) **B** (3) **C** (4) **D** (..4..)

**39.** පළමුවැන්නේ දියුණුව දෙවැන්නේ යහපතට මෙන්ම අයහපතට ද හේතුවන මාතෘකා යුගලය කුමක් ද?
(1) **A** (2) **B** (3) **C** (4) **D** (..1..)

**40.** දෙවැන්නේ අඩුවීම කෙරෙහි පළමුවැන්නේ වැඩිවීම බලපෑ හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) **A** (2) **B** (3) **C** (4) **D** (..2..)

* *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව/இலங்கை பரீட்சைத் திணைக்களம்/Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022 (2023)
General Certificate of Education (Ord. Level) Examination, 2022 (2023)

විභාග අංකය / சுட்டெண் / Index Number ..........

(61) භූගෝල විද්‍යාව II
புவியியல் II
Geography II

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි. / பரீட்சகரின் உபயோகத்திற்கு மட்டும் / For Examiner's Use Only

1. (අ) / (அ) / (a)

(i) කොත් කන්ද — 1

(ii) වගුරු බිම — 1

(iii) 187 m. — 1

(iv) මෙට්‍රික් බන්ධාංක — 1

(v) දිස්ත්‍රික් මායිම — 1

(vi) • පොලීසිය / පාසල — 1
(මේවායින් දෙකක් නම් කිරීම)
• තැපැල් කාර්යාලය — 1


(vii) Y — 1

(viii) Z — 1

(ix) W — 1

10/10

(ආ) / (ஆ) / (b)




(i) W

(ii) R


(iii) O

(iv) T

(v) E

5/5

(ඇ) / (இ) / (c)




(i) R

(ii) U

(iii) W

(iv) A

(v) L

5/5

1. (අ) (அ) (a) 10/10 (ආ) (ஆ) (b) 5/5 (ඇ) (இ) (c) 5/5 = 20/20

# II කොටස

## 02 - ඉගෙනුම් පල :

1. ගෝලීය ජල ව්‍යාප්තිය විස්තර කරයි.
2. ශ්‍රී ලංකාවේ ජල පරිහරණය හා සම්බන්ධ ගැටලු ඉදිරිපත් කරයි.
3. ජල සංරක්‍ෂණ ක්‍රියාමාර්ග විස්තර කරයි.

**II කොටස**

**2.** (i) පෘථිවියේ ජලය ව්‍යාප්ත වී ඇති ආකාර **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ජලයේ ගුණාත්මක බව අඩුවීම කෙරෙහි බලපා ඇති මානුෂ ක්‍රියාකාරකම් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ජල සංරක්ෂණය සඳහා ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කර ඉන් **එක්** ක්‍රියාමාර්ගයක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(02) i.

- සාගර ජලය
- භූතල ජලය
- භූගත ජලය
- වායුගෝලීය ජලය
- පාංශු ජලය

***(මින් දෙකක් නම් කිරීමට ලකුණු 1 + 1 = 02)***

ii.

- කම්හල්වලින් පිට කරන අපවිත්‍ර ජලය සමග විවිධ රසායනික හා කාබනික ද්‍රව්‍ය ජලයට එක්වීම.
- කෘෂිකාර්මික කටයුතු වලදී පසට එකතු කරන පොහොර වර්ග, කෘෂි රසායන ද්‍රව්‍ය ජලය සමග මුසු වීම.
- මලද්‍රව්‍ය අපවහනය නිසා මතුපිට ජලාශ හා භූගත ජලයට අපද්‍රව්‍ය එකතු වීම.
- කැලිකසළ ජලාශවලට බැහැර කිරීම නිසා ජලය අපවිත්‍ර වීම.

***(මෙවැනි මානුෂ ක්‍රියාකාරකම් තුනක් සඳහන් කිරීමට ලකුණු 1 x 3 = 03)***

iii.

- ජලය අරපිරිමැස්මෙන් භාවිත කිරීම.
- ජල නාස්තිය වැලැක්වීම.
- ජලාශ අපවිත්‍ර වන ක්‍රම වලක්වා ලීම.
- ජල සංරක්‍ෂණයේ වැදගත්කම අන් අයට පහදා දීම.
- පෝස්ටර්, චිත්‍ර ප්‍රදර්ශනය මගින් ජල සංරක්‍ෂණයේ වැදගත්කම පහදා දීම.
- ජල කරාම ආදිය නිසි ලෙස නඩත්තු කිරීම.
- ජල මූලාශ්‍ර සංරක්‍ෂණයේ වැදගත්කම පහදා දීම.
- පානීය ජලය වෙනත් කටයුතු සඳහා යොදා නොගැනීම.
- වරක් පාවිච්චි කළ ජලය නැවත භාවිතය (හැකි අවස්ථාවලදී)

***(මෙවැනි ක්‍රියාමාර්ග තුනක් නම් කර ඉන් එක් ක්‍රියාමාර්ගයක් පැහැදිලි කිරීම***
***ක්‍රියාමාර්ග තුන නම් කිරීමට 03***
***එක් ක්‍රියාමාර්ගයක් පැහැදිලි කිරීමට 02***
***මුළු ලකුණු 05)***

## 03 - ඉගෙනුම් පල :

1. පස නිර්මාණය වීමට බලපාන සාධක පැහැදිලි කරයි.
2. පස පරිහරණය හා සම්බන්ධ ගැටලු හා පාංශු සංරක්‍ෂණ ක්‍රම පැහැදිලි කරයි.
3. ජීවීන්ගේ පැවැත්මට පස ප්‍රයෝජනවත් වන ආකාරය පැහැදිලි කරයි.

**3.** (i) පස නිර්මාණය වීමට බලපාන සාධක **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) පස පරිහරණය හා සම්බන්ධ ගැටලු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
(iii) (a) පස සංරක්ෂණය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කරන්න.
(b) ජීවීන්ගේ පැවැත්ම සඳහා පස ප්‍රයෝජනවත් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(03) i.

- මව් පාෂාණය
- භූ විෂමතාව
- දේශගුණය
- ශාක හා සත්ව කොටස්
- කාලය
- මානුෂ ක්‍රියා

***(මින් දෙකක් නම් කිරීමට ලකුණු 1 + 1 = 02)***

ii.

- අධික ලෙස පාංශු ඛාදනය වීම.
- පස ලවණීකරණය වීම.
- පසේ ජලය රඳවාගත හැකි ප්‍රමාණය අඩුවීම.
- පස නිරාවරණය වීම නිසා පසෙහි සාරවත් බව අඩු වීම.
- රසායනික පොහොර, කෘමිනාශක හා වල්නාශක භාවිතය නිසා පස හායනයට ලක් වීම.
- නාය යෑම්, ගංවතුර වැනි ස්වාභාවික විපත් හට ගැනීම.
- භූගත ජල ගබඩාවට ඇති කරන බලපෑම්
- පාංශු ජීවීන් විනාශ වීම.

***(මෙවැනි ගැටලු තුනක් සඳහන් කිරීමට ලකුණු 1 x 3 = 03)***

iii. (a)

- පසට සුදුසු භෝග තෝරා ගැනීම හා කළමනාකරණය.
- පොහොර භාවිතය විධිමත් කිරීම හා ජෛවීය පොහොර භාවිතය වැඩි දියුණු කිරීම.
- පස ආවරණ භෝග වැවීම.
- සමෝච්ඡ රේඛා ආකාරයට බෑවුම් හරහා පස පෙරලීම.
- තීරු වගා ක්‍රමය.
- බෝග අවශේෂ පොහොර ලෙස යොදා ගැනීම.
- කුට්ටි කානු කැපීම හා ගල් වැටි ඇමීම.
- දළ බෑවුම් ප්‍රදේශවල වගා නොකිරීම.

***(මෙවැනි ක්‍රියාමාර්ග තුනක් සඳහන් කිරීම)***

(b)

- ශාක හා සත්ත්ව සංහතියේ පැවැත්මට පස උපකාරී වීම.
- ශාක වර්ධනයට අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ ද ජලය ද සපයන්නේ පස මගිනි.

- ජෛව විවිධත්වය කෙරෙහි පස බලපායි.
- බැක්ටීරියා හා පාංශු ජීවීන්ගේ පැවැත්මට පස ප්‍රයෝජනවත් ය.

***(මෙවැනි කරුණු අනුව පස ජීවීන්ගේ පැවැත්මට බලපාන ආකාරය පැහැදිලි කිරීම***
***(a) ලකුණු 03***
***(b) ලකුණු 02***
***මුළු ලකුණු 05)***


**04 - ඉගෙනුම් පල :**

1. ලෝකයේ කෘෂි කර්මාන්තයට ඇති වැදගත්කම පැහැදිලි කරයි.
2. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක දැක්වෙන ආකෘති සිතියමක් ඇසුරෙන් තේ, රබර් සහ පොල් වගා සඳහා වැදගත් දිස්ත්‍රික්ක හඳුනාගෙන නම් කරයි.
3. පොල් ආශ්‍රිත නිෂ්පාදන විවිධාංගීකරණය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට හේතුවන ආකාරය නිදසුන් දෙමින් පැහැදිලි කරයි.

**4.** (i) ලෝක කෘෂිකර්මය දිගු කලක් තිස්සේ වෙනස්කම්වලට භාජනය වෙමින් පැවතුණද වර්තමානයේත් එහි වැදගත්කම අඩු වී නැත. එසේ වීමට හේතු **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ii) යාබද සිතියමෙහි Ⓐ, Ⓑ සහ Ⓒ යනුවෙන් දිස්ත්‍රික්ක යුගල තුනක් දක්වා ඇත. තේ, පොල් සහ රබර් යන වගා අතුරින් Ⓐ, Ⓑ සහ Ⓒ යන දිස්ත්‍රික්ක යුගලවල ප්‍රමුඛස්ථානය ගන්නා වගාව කුමක් දැයි අනුපිළිවෙළින් දක්වන්න. (ලකුණු 03 යි)

(iii) පොල් ආශ්‍රිත නිෂ්පාදන විවිධාංගීකරණය කිරීම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට හේතුවන ආකාරය නිදසුන් **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)




(04) i.

- ලෝක ජනතාවට අවශ්‍ය ආහාර මෙන්ම සත්ත්ව නිෂ්පාදන ද පානීය අවශ්‍යතා ද සැපයීම
- කාර්මික ක්ෂේත්‍රයට අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීම
- ලෝක ජන සංඛ්‍යාවෙන් බහුතරය කෘෂි අංශයේ රැකියාවල නිරත වීම.
- ලෝක වෙළෙඳාමේ දී කෘෂි නිෂ්පාදන වැදගත් තැනක් ගැනීම.

***(මෙවැනි හේතු දෙකක් සඳහන් කිරීමට ලකුණු 1 + 1 = 02)***

ii. A – පොල්

B – රබර්

C – තේ

***(නම් කිරීමට ලකුණු 1 x 3 = 03)***

iii.

- වෙනත් භෝගවලට වඩා විවිධ නිෂ්පාදන පොල් ආශ්‍රිතව කළ හැකි වීම.(ආහාර පාන, සැරසිලි, ගෘහ භාණ්ඩ, විසිතුරු භාණ්ඩ, සත්වාහාර, කාර්මික අමුද්‍රව්‍ය)
- බොහොමයක් නිෂ්පාදන අඩු ප්‍රාග්ධනයකින් කළ හැකි වීම.

- පොල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා දේශීය මෙන්ම විදේශීය වශයෙන් පුළුල් වෙළෙඳපොළක් පැවතීම.
- කර්මාන්ත ගණනාවකට අමු ද්‍රව්‍ය ලෙස පොල් ආශ්‍රිත නිෂ්පාදන වැදගත් වීම
- බොහෝ පිරිසකට රැකියා සැපයීමේ හැකියාව තිබීම.

***(මෙවැනි කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කිරීම නිදසුන් සහිතව පැහැදිලි කිරීමට ලකුණු 05)***

## 05 - ඉගෙනුම් පල :

1. කර්මාන්ත ස්ථාන ගත වීම කෙරෙහි බලපාන සාධක නම් කරයි.
2. කෘෂි බෝග පාදක, ඛනිජ පාදක හා සේවා පාදක කර්මාන්තවලට නිදසුන් දක්වයි.
3. ශ්‍රී ලංකාවේ පිඟන් මැටි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය හා සම්බන්ධ නව ප්‍රවණතා සඳහන් කරයි.
4. පිඟන් මැටි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට දායක වන ආකාරය පැහැදිලි කරයි.

**5.** (i) කර්මාන්ත ස්ථානගතවීම කෙරෙහි බලපාන සාධක **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ කර්මාන්ත කිහිපයක් පහත වරහන් තුළ සඳහන් වේ.

(මැණික්, සංචාරක, සහල් පිටි නිෂ්පාදන, මිනිරන්, ටයර් ටියුබ්, වෙළෙඳාම)

ඉහත කර්මාන්ත අතුරින්

(a) කෘෂි බෝග පාදක කරගත් කර්මාන්ත **එකක්** ද

(b) ඛනිජ පාදක කර ගත් කර්මාන්ත **එකක්** ද

(c) සේවා පාදක කර ගත් කර්මාන්ත **එකක්** ද නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ පිඟන් මැටි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය හා සම්බන්ධ නව ප්‍රවණතා **තුනක්** සඳහන් කර එමඟින් රටේ ආර්ථික සංවර්ධනයට ලැබෙන දායකත්වය පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(05) i.

- ශ්‍රමය
- ප්‍රාග්ධනය
- බල ශක්තිය
- අමු ද්‍රව්‍ය
- ප්‍රවාහනය
- යටිතල පහසුකම්
- වෙළෙඳපොල
- රාජ්‍ය ප්‍රතිපත්ති

***(මින් දෙකක් සඳහන් කිරීමට ලකුණු 1 + 1 = 02)***

ii. (a) සහල් පිටි ආශ්‍රිත නිෂ්පාදන / ටයර් ටියුබ් - මින් එකක් නම් කිරීම

(b) මැණික් / මිනිරන් - මින් එකක් නම් කිරීම

(c) සංචාරක / වෙළෙඳාම - මින් එකක් නම් කිරීම

***(a) 1 (b) 1 (c) 1 = ලකුණු 03***

iii. ✶ නව ප්‍රවනතා

- මුළුමනින්ම පෞද්ගලික අංශයට නැඹුරු වූ කර්මාන්තයක් වීම.
- ඉහළ තාක්ෂණයක් හා පුහුණු ශ්‍රමිකයන් යොදා ගැනීම මත ගුණාත්මක භාණ්ඩ නිෂ්පාදනය කිරීම.
- දේශීය මෙන්ම විදේශීය වශයෙන් ද උසස් පිළිගැනීමක් මෙම භාණ්ඩ සඳහා ලැබීම
- සංවර්ධිත රටවලින් වැඩි ඉල්ලුමක් පැවතීම. (ඇ.එ.ජ., ජපානය, කැනඩාව, ඕස්ට්‍රේලියාව, යුරෝපා සංගමය)
- පිඟන් මැටි ආශ්‍රිත විසිතුරු භාණ්ඩ සඳහා විශාල ඉල්ලුමක් වර්ධනය වීම.
- පිඟන් ගඩොල් හා සනීපාරක්ෂක කට්ටල සඳහා දේශීය ඉල්ලුම ක්‍රමිකව ඉහළ යාම.
- ප්‍රමාණයෙන් විශාල හා ගුණාත්මක පිඟන් ගඩොල් නිෂ්පාදනය පුළුල් වීම.

***(මෙවැනි ප්‍රවනතා තුනක් නම් කිරීම)***

✶ ආර්ථිකයට ලැබෙන දායකත්වය

- විදේශ විනිමය ඉපැයීම.
- රැකියා අවස්ථා සැපයීම.
- සියලු අමුද්‍රව්‍ය දේශීයව ලබා ගත හැකි වීම නිසා අමුද්‍රව්‍ය ආනයනය සඳහා මුදල් වැය නොවීම.

***(ප්‍රවනතා තුන නම් කිරීමට ලකුණු 03***
***ආර්ථිකයට ලැබෙන දායකත්වය විස්තර කිරීමට ලකුණු 02***
***මුළු ලකුණු 05)***

## 06 - ඉගෙනුම් පල :

1. මහද්වීප අනුව ලෝක ජන සංඛ්‍යාවේ විශාලත්වය විස්තර කරයි.
2. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ ගති ලක්ෂණ විස්තර කරයි.
3. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යාප්තියේ විශේෂිත ලක්ෂණ පැහැදිලි කරයි.

**6.** (i) ලෝක ජන ව්‍යාප්තිය අනුව,
(a) වැඩිම ජන සංඛ්‍යාවකින් යුතු මහාද්වීපය ද
(b) අඩුම ජන සංඛ්‍යාවකින් යුතු මහාද්වීපය ද නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටක් වුව ද ජන සංඛ්‍යාවේ ඇතැම් ලක්ෂණ අනුව සංවර්ධිත රටක ස්වභාවය දක්නට ඇත. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවෙහි පවත්නා එවැනි ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක අධික ජන සංඛ්‍යාවකින් යුක්තවීම කෙරෙහි බලපා ඇති හේතු **තුනක්** සඳහන් කරන්න.
(b) මෙම දිස්ත්‍රික්ක දෙකෙහි ජනාධික බව හේතු කොට ගෙන පැන නැගී ඇති ගැටලුවක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

i. (a) ආසියාව
(b) ඕස්ට්‍රේලියාව

***(මහද්වීප දෙක නම් කිරීමට ලකුණු 1 + 1 = 02)***

ii.

- ළදරු මරණ සංඛ්‍යාව අඩුවීම.
- මාතෘ මරණ සංඛ්‍යාව අඩුවීම.
- ආයු අපේක්ෂාව ඉහළ මට්ටමක පැවතීම.

- සාක්ෂරතාව ඉහළ අගයක් ගැනීම.
- ජන සංඛ්‍යාවේ වාර්ෂික වර්ධන වේගය අඩු අගයක් ගැනීම.

***(මෙවැනි ලක්ෂණ තුනක් සඳහන් කිරීමට ලකුණු 1 x 3 = 03)***

iii. (a) **කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක ජනාධික වීමට හේතු**

- දිවයිනේ ප්‍රධානතම වාණිජ කටයුතු ඒකරාශී වී තිබීම.
- දිවයිනේ පරිපාලන කටයුතු ඒකරාශී වී තිබීම.
- අධ්‍යාපන කටයුතු හා සේවා ඒකරාශී වී තිබීම.
- යටිතල පහසුකම් බහුල වීම.
- කර්මාන්ත කටයුතුවල ව්‍යාප්තිය.
- කටුනායක හා බියගම නිදහස් වෙළෙඳ කලාප පිහිටා තිබීම නිසා සිදුවන ජන සංක්‍රමණ
- පහසුවෙන් කොළඹට ලඟා වීමට හැකි වීම නිසා පදිංචිය සඳහා තෝරා ගැනීම.

***(මෙවැනි හේතු තුනක් සඳහන් කිරීමට ලකුණු 1 x 3 = 03)***

(b) **ගැටලු**

- ඉඩම් හිඟය - ඒක පුද්ගල බිම් ප්‍රමාණය අඩුවීම / ඉඩම් කැබලි වීම.
- නිවාස හිඟය.
- මුඩුක්කු හා පැල්පත් බිහිවීම.
- මාර්ග තද බදය.
- සමාජ අපචාර හා මත්ද්‍රව්‍ය භාවිතය බහුල වීම.
- පරිසර දූෂණය.
- කැලි කසළ අවිධිමත්ව බැහැර කිරීම නිසා ඇතිවන ගැටලු.
- වසංගත රෝග ව්‍යාප්තිය තීව්‍ර වීම.

***(මෙවැනි ගැටලුවක් පැහැදිලි කිරීමට ලකුණු 02***
***(a) ලකුණු 03***
***(b) ලකුණු 02***
***මුළු ලකුණු 05)***

**07- ඉගෙනුම් පල :**

1. සංවර්ධනය මැනීමට භාවිත කරන නූතන මිනුම් නම් කරයි.
2. ශ්‍රී ලංකාවේ මෑත කාලීනව ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ විස්තර දක්වයි.

**7.** (i) රටක සංවර්ධන මට්ටම මැනීම සඳහා යොදා ගන්නා නූතන මිනුම් **දෙකක්** සඳහන් කරන්න.(ලකුණු 02 යි)

(ii) පසුගිය දශකය තුළ ශ්‍රී ලංකාවේ පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ ක්‍රියාත්මක කරන ලද නව සංවර්ධන ව්‍යාපෘතිවලට නිදසුන් **එක බැගින්** දක්වන්න.

(a) වරාය
(b) ගුවන් තොටුපළ
(c) අධිවේගී මාර්ග (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග තැනීම නිසා අත් වූ යහපත් ප්‍රතිඵල **තුනක්** නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

i. • භෞතික ජීවන තත්ත්ව දර්ශකය - (P.Q.L.I)
- මානුෂ සංවර්ධන දර්ශකය (H.D.I)

- මානුෂ දරිද්‍රතා දර්ශකය (H.P.I)
- මානුෂ පීඩක දර්ශකය (H.S.I)

***(මින් දෙකක් නම් කිරීමට ලකුණු 1 + 1 = 02)***

ii. (a) **වරාය**

- හම්බන්තොට මාගම්පුර වරාය ඉදිකිරීම
- කොළඹ වරාය සංවර්ධනය
- ගාලු වරාය සංවර්ධනය
- කන්කසන්තුරේ වරාය සංවර්ධනය
- ඔලුවිල් වරාය

***(මෙවැනි නිදසුනක් දැක්වීම)***

(b) **ගුවන්තොටුපළ**

- මත්තල නව ගුවන්තොටුපළ ඉදිකිරීම
- කටුනායක ගුවන්තොටුපළ සංවර්ධනය
- පලාලි ගුවන්තොටුපළ සංවර්ධනය
- රත්මලාන ගුවන්තොටුපළ සංවර්ධනය

***(මෙවැනි නිදසුනක් දැක්වීම)***

(c) **අධිවේගී මාර්ග**

- කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය ඉදිකිරීම
- කොළඹ - මත්තල අධිවේගී මාර්ගය ඉදිකිරීම
- කොළඹ - පිටත වටරවුම් පාර ඉදිකිරීම
- කොළඹ - මහනුවර අධිවේගී මාර්ගයේ කුරුණෑගල - මීරිගම කොටස ඉදිකිරීම

***(මෙවැනි නිදසුනක් දැක්වීම)***

***(a) 1 (b) 1 (c) 1 = ලකුණු 03***

iii.

- ගමනාන්ත කරා ඉක්මනින් ළඟාවිය හැකිවීම.
- ගතවන කාලය හා භෞතික දුර අවම වීම.
- ඉන්ධන පිරිමැස්ම.
- මාර්ග තදබදය අවම වීම.
- භාණ්ඩ ප්‍රවාහනය ඉක්මන් වීම.
- පරිසර දූෂණය අවම වීම.

***(මෙවැනි ප්‍රතිඵල තුනක් නිදසුන් සහිතව විස්තර කිරීම ලකුණු 05)***

**08 - ඉගෙනුම් පල :**

1. ලෝකයේ භූමිකම්පා හටගන්නා ප්‍රධාන කලාප නම් කරයි.
2. ශ්‍රී ලංකාවට බලපාන ස්වාභාවික ආපදා නම්කර ඒවාට හේතු දක්වයි.
3. ආපදා අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරයි.

8. (i) ලෝකයේ භූමිකම්පා ඇතිවන ප්‍රධාන කලාප **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ නායයෑම් හටගැනීම කෙරෙහි බලපාන ස්වාභාවික හේතු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) ශ්‍රී ලංකාවේ නායයෑම් තීව්‍රවීම කෙරෙහි බලපාන මානුෂ ක්‍රියාකාරකම් **තුනක්** දක්වන්න.

(b) නායයෑම් ආපදාව අවම කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගයක් දක්වා එය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

i.
- පැසිෆික් සාගරය වටා විහිදී ඇති පැසිෆික් කලාපය (පැසිෆික් ගිනි වළල්ල, පරි පැසිෆික් කලාපය)
- මධ්‍යධරණී - හිමාලයා කඳු කලාපය
- මධ්‍ය අත්ලන්තික් සාගරික වැටි කලාපය
- අප්‍රිකානු සුවිභේද නිම්න කලාපය

***(මෙයින් කලාප දෙකක් නම් කිරීමට ලකුණු 1 + 1 = 02)***

ii.
- භූ චලන හටගැනීම.
- අධික වර්ෂාපතනය.
- කඳු බෑවුම්වල ශීඝ්‍ර ආනතිය.
- පාෂාණ ව්‍යූහය හා එහි දිරාපත් වීම.
- දුර්වල ජලවහන රටාව.
- වෘක්ෂ ලතා වැස්ම අඩුවීම.

***(මෙවැනි කරුණු තුනක් නම් කිරීමට ලකුණු 1 x 3 = 03)***

iii. (a)
- අවිධිමත් ලෙස බෑවුම් ඉඩම් පරිහරණය.
- බෑවුම් ප්‍රදේශවල වන වැස්ම ඉවත් කිරීම.
- ස්වාභාවික ජලමාර්ග ඉවත් කිරීම.
- කඳුකර ප්‍රදේශවල පතල් කැනීම.
- පස් කඳු කැපීම, ගල් කැඩීම හා පිපිරවීම.
- කඳු බෑවුම්වල සිදුකෙරෙන අවිධිමත් ඉදිකිරීම්.
- කඳු ප්‍රදේශවල විශාල ජලාශ ඉදිකිරීම.

***(මෙවැනි ක්‍රියාකාරකම් තුනක් නම් කිරීමට ලකුණු 03)***

(b)
- බෑවුම් ඉඩම්වල ඇති වෘක්ෂලතා වැස්ම ආරක්ෂා කිරීම.
- ස්වාභාවික ජලවහනය අවහිර නොකිරීම.
- බෑවුම් ඉඩම් පරිහරණයේ දී විද්‍යාත්මක උපදෙස් අනුගමනය කිරීම.
- උස් ප්‍රදේශවල ජලාශ ඉදි නොකිරීම.
- ශීඝ්‍ර බෑවුම් ඉඩම්වල ගොඩනැගිලි ඉදි නොකිරීම.
- බෑවුම් සහිත ඉඩම්වල ස්ථායීතාව ආරක්ෂා කිරීමට ක්‍රියාමාර්ග ගැනීම. (ගල් වැටි, කුට්ටිකානු, වන වගා ආදිය)
- ප්‍රජාව දැනුවත් කිරීම.

***(මින් ක්‍රියාමාර්ගයක් විස්තර කිරීමට ලකුණු 02)***

***(a) 3 (b) 2 = ලකුණු 05***